# කල්‍යාණී ශිලාලේඛනය ලාංකිකයන්ට වැදගත්කම

දිනේෂ මධුශංඛ රත්නායක[1]

## හැඳින්වීම හා පර්යේෂණ අරමුණ

යම් රටක දේශපාලනික, ආර්ථික, ආගමික, අධ්‍යාපනික, සාමාජික හා සංස්කෘතික වශයෙන් ගෙවී ගිය කාල පරිච්ඡේදයන් ලිඛිත සාධක පදනම් කොට ගෙන කරනු ලබන අධ්‍යයනය ඉතිහාසය ලෙස සරල ව අරුත් ග්‍රහණය කරගත හැකි ය. ඓතිහාසික කරුණු සනාථ කර ගැනීම සඳහා වඩා ප්‍රබල සාධක වන්නේ පුරාවිද්‍යාත්මක දත්තයන් ය. ඉතිහාසය නිරාවරණය කරනු ලබන පුරාවිද්‍යා සාධක අතර, ඉතා වැදගත් සාධක වන්නේ අභිලේඛනමය සාධකයන් ය. ඓතිහාසික ලේඛනවල සඳහන් තොරතුරු අභිලේඛන සාධක මඟින් සනාථ වන්නේ නම් ඒවා වඩා තීව්‍ර ලෙස සමාජගත වේ. මේ අනුව ඉතිහාසයේ යම් යම් කරුණු නිරාවරණය කර ගැනීමට අභිලේඛනවලින් ලැබෙන පිටිවහල සුවිශාල බව කිව හැකි ය. එසේ ඉතිහාසය නිරාවණය කර ගැනීමට වැදගත් ශිලාමය සාධකයක් ලෙස කල්‍යාණී ශිලාලේඛනය හඳුනා ගත හැකි ය. මෙම කල්‍යාණී සෙල්ලිපිය ඔස්සේ එකල සමාජ, ආර්ථික, දේශපාලන සහ ආගමික පරිසරය වැනි පුළුල් වපසරිය අධ්‍යයනය කළ හැකි ය. කල්‍යාණී සෙල්ලිපියේ ලාංකික වැදගත්කම අධ්‍යයනය කිරීම මෙහි අරමුණ යි.

## පර්යේෂණ ක්‍රමවේදය

කල්‍යාණී සෙල්ලිපියේ ලාංකික වැදගත්කම අධ්‍යයනය කිරීමේ දී ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය කරන ලදී. ඒ අනුව ලක්දිව සෙල්ලිපි, කල්‍යාණී ශිලාලිපි, පොල්වත්තේ බුද්ධදත්ත හිමිගේ පාලි සාහිත්‍යය වැනි කෘති කිහිපයක් භාවිත කළේ ය.

## පර්යේෂණ සීමාව

කල්‍යාණී සෙල්ලිපිය හා එහි  ලාංකික වැදගත්කම මෙහි සීමාව යි.

## පර්යේෂණ ගැටලුව

කල්‍යාණී ශිලාලේඛනය ලාංකිකයන්ට වැදගත්කම කුමක් ද?

## පර්යේෂණ සාකච්ඡාව

විදේශීය ශිලාලේඛනයක ලංකාවේ දේශපාලනික සමාජ තොරතුරු වැඩි ප්‍රමාණයක් සටහන් වන අවස්ථාවක් ලෙස කල්‍යාණී ශිලාලිපි හඳුන්වා දිය හැකි ය. මෙම ලිපියේ රාමඤ්ඤදේශයේ සහ ලංකාද්වීපයේ ඓතිහාසික තොරතුරු රාශියක් සඳහන් ව තිබේ.

[1]. උපාධි අපේක්ෂක, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම. *Madusankadinesh444@gmail.com*

ක්‍රි.ව. 1478 දී රාමඤ්ඤ දේශයේ රජ වූ ධම්මචෙතිය රජු විසින් එතුමාගේ රාජධානිය වූ හංසාවතී නුවර මෙම ලිපි පිහිටුවා තිබේ. කෝට්ටේ රජ වූ සවෙනි බුවෙනකබා රජු හා ධම්මචෙතිය රජු සමකාලීනයන් ය. ඉතා වැදගත් ඓතිහාසික කරුණු ඇතුළත් මෙම ලිපිය උසින් අඩි 7ක් සහ පළලින් අඩි 4ක් වන අතර, ඝනකමින් අඩි තුනකුත් අඟල් 3ක් වන සේ පුවරු තුනක් ඉදිකර තිබේ. තවත් එම ස්වරූපයේ ම පුවරු හතක රාමඤ්ඤ බසින් ලියන ලද ලිපියක් ද එහි පිහිටුවා තිබේ. කල්‍යාණී සීමාව අසල පිහිටුවා තිබූ මෙම ලිපි 17 වැනි සියවසේ රාමඤ්ඤ දේශයට පැමිණි "පිල්ප් ඩී. බ්‍රිටෝ" ප්‍රධාන පෘතුගීසි හමුදාව විසින් හෝ ක්‍රි.ව. 1757 දී එම නුවර යටත් කරගත් "අලෞංප්‍රා" නම් වූ බුරුම රජ සේනාව විසින් හෝ කඩා බිඳ දමන ලදී. මෙරට ඉංග්‍රීසීන්ට යටත් වූ පසු ආණ්ඩුවේ අණ පරිදි "ආර්.සී. ටැම්පල්'' මහතා විසින් මේ කැබලි හැකි පමණින් එක්කොට සංරක්‍ෂණය කොට තිබේ.

බුද්ධවර්ෂ 2002 දී රාජ්‍ය පදවියට පත් ධම්මචේතිය රජු ධර්මවිනය මැනවින් දත් රජ වීමට පූර්වයෙහි මහණදම් පිරූ අයෙකු බැවින් තම රටේ උපසම්පදා විනයකර්ම සිදු කරන සීමාවන් අපිරිසිදු බැව් වටහා ගෙන එවකට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ රජ වූ සවැනි බුවනෙකබාහු රජු වෙත අමාත්‍යයන් දෙදෙනෙකු සහිත සඟපිරිසක් ඒවා කැලණිගඟේ පැන වූ උදකුක්ඛෙප සීමා මාලකයේ දී විදාගම මා හිමි ඇතුළු ලංකාවේ භික්ෂූන් වහන්සේලාගෙන් උපසම්පදාව ලබා රාමඤ්ඤදේශයට ගොස් හංසාවතී නුවර සීමාවක් බඳවා එරට පිරිසිදු උපසම්පදාව යළි පිහිටුවීම කල්‍යාණී ශිලාලේඛනයේ අන්තර්ගත වේ.

ක්‍රි.ව. 1908 දී කල්‍යාණී සීමාව (හංසාවතී නුවර පැවති කල්‍යාණී සීමාව) තුළ පිහිටි ගොඩනැඟිලි ජරාජීර්ණ ව පැවති බවත් දෙවන ලෝක යුදසමයේ එම ගොඩනැඟිලි විනාශ වූ බවත් නැවත 1955 දී පමණ එම ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණය කරන ලද බවත් මහාචාර්ය පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් වාර්තා කර තිබේ.

කල්‍යාණී ශිලාලේඛනය ගාථාවකින් ආරම්භ වන අතර, අනතුරු ව ගද්‍යමය ස්වරූපයෙන් විස්තර ඉදිරිපත් කර තිබේ.

**"රාමඤ්ඤදෙසපතිභූ - රාමාධිපතිනා කතා**

**ජිනසාසනසංසුද්ධි - තම්පවත්ති කථීයතෙ"**

"රාමඤ්ඤදේශාධිපති වූ රාමාධිපති මහ රජ විසින් සර්වඥ ශාසනශුද්ධියක් කරන ලදී. ඒ ප්‍රවෘත්තිය මෙහි කියනු ලැබේ."

මෙසේ ගාථාවකින් අරඹා ගද්‍ය ස්වරූපයෙන් නිර්මිත කල්‍යාණී ශිලාලිපියේ අවසානයේ ගාථා 19ක් යොදා සෙල්ලිපිය අවසන් කොට ඇත.

**"යතතං තිභවාසගතා තරිතුං - දුරිතෙ කසිරායතනෙ ජහිතුං**

**අරියං පදවිං පවරං ගමිතුං - අධිබොධිබුධා ලලිතං ලභිතුං"**

පෙර රජවරුන් ශාසනශෝධනය කළ ආකාරයත් අනාගතයේ රජවරුන් විසින් ද හංසාවතී පුරවාසී භික්ෂු සඞ්ඝයා විසින් ද ශාසනමලය ශුද්ධ කළ යුතු බව දක්වා කල්‍යාණී සෙල්ලිපිය රචනා කිරීම අවසාන කර තිබේ.

කල්‍යාණී ශිලාලේඛනවල සඳහන් බුවනෙකබාහු රජු නම් ජයවර්ධනපුරයෙහි වසර පනස් දෙකක් රාජ්‍ය කර වූ සවෙනි පරාක්‍රමබාහු රජුගේ පුත්‍රස්ථානයෙහි වැඩුණු සපුමල් කුමාරයා යි. පරාක්‍රමබාහු රජුගේ අභාවයෙන් පසු ඔහුගේ මුණුපුරු හෙවත් උලකුඩය දේවියගේ පුත්‍ර වූ ජයබාහු වසර දෙකක් රජය කරවී ය. යාපා පටුනෙහි සිටි සපුමල් කුමාරයා මේ බව දැන බලසේනාව ගෙනවුත් ජයබාහු මරා රාජ්‍ය අත්පත් කරගත්තේ ය. මේ අනුව බුවනෙකබාහු නමින් සපුමල් කුමාරයා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ රජ විය.

බුවනෙකබාහු රජු මිය යන ලද්දේ බුද්ධවර්ෂ 2010 දී හෙවත් ක්‍රි.ව. 1467 දී ය. සපුමල් කුමාරයා සවෙනි බුවනෙකබාහු නමින් රාජ්‍යත්වයට පත් වූයේ බු.ව. 2012 දී ය. රාමඤ්ඤ රට ධම්මචේතිය රජු රාජ්‍යත්වයට පැමිණියේ බු.ව 2002 දී බව ශිලාලේඛනයේ සඳහන්ව තිබේ. මේ අනුව ධම්මචේතිය රජු රාජ්‍යත්වයට පත්වීමෙන් දස වසරකට පසු සවෙනි බුවනෙකබාහු රජතුමා රාජ්‍යත්වයට පත් වූ බව පෙනේ. බුවනෙකබාහු රජුගේ පස්වන රාජ්‍ය කාලයේ හෙවත් බු.ව 2017 දී රාමඤ්ඤ භික්ෂූහු ලක්දිවට පැමිණියහ. ඉන් වසර තුනකට පසු බුවනෙකබාහු රජු මරණයට පත්ව තිබේ.

**"සෙතගජපතිස්ස භන්තෙ රාමාධිපතිමහාරාජස්ස අඤ්ඤෙහි පහිතපණ්ණාකාරෙහි සහ මම පිතු පරක්කමබාහුමහාරාජස්ස නිච්චවලඤ්ජිතසතඵලපරිමාණං ඵුස්සරාග-වජිරමණිපරිකතං සිරිදාඨධාතුබිම්බපසඞ්ඛාතං ධම්මිකපණ්ණාකාරං පහිනිතුං දූතං පෙසෙතුම්ච්ඡාමි"** "මගේ පියා වූ පරාක්‍රමබාහු මහ රජතුමන් නිතර පරිභෝග කරන ලද පලම් සියයක් පමණ අගනා පුෂ්පරාගවලින් හා දියමන්තිවලින් කරන ලද සිරි දළදා පිළිබිඹු නැමති ධාර්මික පඬුර..." යනුවෙන් දෙවන ගලේ පසුපස සඳහන් කාරණාවන්ට අනුව පරාක්‍රමබාහු රජු පිතෘත්වයෙහි ලා සැලකූ බවට බුවනෙකබාහු රජු සඳහන් කොට තිබීම දැකගත හැකි ය. ජයබාහු කුමරු නසා බුවනෙකබාහු කුමරා රජ වූ බව මහාවංශය ද සඳහන් කර තිබේ.

ලංකාවේ ශාසනශුද්ධියක් කළ බව පළමු ගලෙහි ඉදිරිපස දැක්වෙන තොරතුරු අනුව පෙනේ. ඒ 526 වන ශතවර්ෂයේ දී ය. **"526 වන ශතවර්ෂයෙහි ලංකාද්වීපයෙහි ශ්‍රී සඞ්ඝබෝධි පරාක්‍රමබාහු රජ තෙම ශාසනය ශුද්ධ කළේ ය."**

මෙහි දක්වා ඇති "සඞ්ඝබෝධි පරාක්‍රමබාහු" නම් පොළොන්නරු යුගයේ ශාසනය ශෝධනය කළ මහා පරාක්‍රමබාහු රජතුමා ය. මෙතුමා දිඹුලාගල මහාකාශ්‍යප තෙරුන්ගේ ද ආධාර සහිතව ඉතා දුෂ්කර වූ කාර්යභාරයන් රාශියක් කොට තුන්නිකාය සමගි කර වූ බව නිකායසඞ්ග්‍රහය ආදියේ සඳහන් වන අතර, කල්‍යාණී සෙල්ලිපියේ ද මෙම කාරණාව ලුහුඬින් දක්වා තිබේ.

ලංකාද්වීපශාසනයේ නිකායභේදය ඇති වූ ආකාරය මෙම ලිපියේ විස්තර කර තිබේ. එම විස්තරය මහාවංශයේ එන නිකායභේදය පිළිබඳ විස්තරයට හා ලංකාවේ සෙසු ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් තොරතුරුවලට බොහෝ සමානකමක් දක්වන බව පෙනේ.

**"ඉක්බිති දෙවානම්පියතිස්ස නම් සිංහලරජතෙම තෙරුන්වහන්සේ කෙරෙහි පැහැද මහාවිහාරය පිහිටුවිය. මහාවිහාරය පිහිටෙව්  තැන් පටන් දෙසිය අටළොස්වසක් ශාසනය පරිශුද්ධවිය, එකම මහාවිහාරවාසීනිකාය පැවැත්තේය. යම් කලෙක වනාහි වට්ටගාමිණීඅභය (වළගම්අබා) නම් රජතෙම දාඨියනම් දෙමළ රජු පරදවා ලඞ්කාද්වීපයෙහි රාජ්‍යයට පැමිණ අභයගිරිවිහාරය කරවා (පෙර) දෙමළුන් සදෙනට පැරද පලාගොස් තුදුස් (14) අවුරුද්දක් සැඟවී වසනකල්හි නිතර උපකාරකළ මහාතිස්ස නම් තෙරුන් ගෙනවුත් උන්වහන්ටේ (ඒ විහාරය) දුන්නේ ද, ඒ කුලසංසගීයෙහි යෙදුණු මහාතිස්සතෙර වනාහි ඒ දෝෂය නිසා මහාවිහාරවාසී භික්ෂුසඞ්ඝතෙම මහවෙහෙරින් පිට කළේ ය. එතැන් පටන් මහවෙහෙර වැසි භික්ෂූහු ද අභයගිරිවැසි භික්ෂූහු ද වෙන්ව බිඳී නිකාය දෙකක් වූහ.**

**ඒ අභයගිරිවෙහෙර පිහිටුවීමෙන් තුන්සියසත්පනස් වසක් ඉක්මිකල්හි මහාසෙන නම් රජතුමෙක් ලඞ්කාද්වීපයෙහි සත්විසිවසක් රාජ්‍ය කරවීය. ඒ කාලයෙහි ඒ රජතෙම ජේතවන විහාරය කරවා දකුණුවෙහෙරවැසි කුටිලගති ඇති නො හික්මුණු පාපමිත්‍රයන් ඇති තිස්ස නම් තෙරට පැහැද දුන්නේ ය. ඉන්පසු ජෙතවනවෙහෙරවැසි භික්ෂුසමූහතෙම මහවෙහෙරවැසි භික්ෂූන් හා ද අභයගිරිවැසි භික්ෂූන් හා ද බිඳි ජෙතවනවාසීනිකාය නම් එක් නිකායක් විය."**

සුවණ්ණසෝභන මහ තෙරුන් තමාගේ උපසම්පදාවේදී **"මහරජ කලම්බුනම් මහාජාතස්සර උදකුක්ඛෙපසීමාවෙහි ගණයාගේ සමීපයෙහි වනරතන නම් පුරාණ සඞ්ඝරාජ තෙරුන් උපාධ්‍යාය කොට පෙර රාහුලභද්‍ර නම් වූ දැන් විජයබාහු සඞ්ඝරාජයන් කර්මාචාර්ය කොට උපසම්පදා වීමි"** යනාදි වශයෙන් දක්වා ඇති පරිදි රාමඤ්ඤ දූතපිරිස මෙරටට පැමිණෙන විට සඞ්ඝරාජ පදවිය දරණ ලද්දේ තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන් බව සනාථ කරගත හැකි ය. සඞ්ඝරාජ පදවියක් පිළිබඳ තොරතුරු මුලින් ම අසන්නට ලැබෙනුයේ පොළොන්නරු යුගයේ ය. ඒ මහා පරාක්‍රමබාහු දවසයි. ශාසනශුද්ධිය කළ මහා පරාක්‍රමබාහු රජතුමා මුල් ම සඞ්ඝරාජ පදවිය දිඹුලාගල අරණ්‍යවාසී සාරිපුත්ත මාහිමියන්ට ප්‍රදානය කළ බවට ඓතිහාසික සාධක තිබේ. එදවස මහා ස්වාමි ලෙස තෙරවරු සිටිය ද ඊට වඩා උත්තරීතර පදවියක් ලෙස සඞ්ඝරාජ පදවිය වූ බවට තහවුරු වෙයි. කල්‍යාණී සෙල්ලිපියෙහි ද ධර්මකීර්ති, වනරතන, මඞ්ගල වැනි තෙරවරුන් සිටි බවත් ශ්‍රී රාහුල මාහිමි සඞ්ඝරාජ වූ බවත් සඳහන් වෙයි. ඇතැම් විට 'මහා ස්වාමි' යන්නට පරියාය පදයක් ලෙස 'සඞ්ඝරාජ' යන්න යෙදෙන්නට ඇතැයි ද සිතිය හැකි ය.

කල්‍යාණී ශිලාලේඛනයේ දෙවන ගලේ පසුපස ලංකාවේ උපසම්පන් වූ රාමඤ්ඤ තෙරුන් දෙව්සි නමට ගුජරාටයේ තැනූ එක් තිර රෙද්දක් බැගින් පුජා කළ බව සඳහන් වේ. එසේ ම ලංකාවේ සාදන ලද සම්කඩක් බැගින් ද ඇත්දත් කැටයම්  කරන ලද විජිනිපත් ද, බුලත්විට පෙට්ටිය ද පුජා කළ බව සඳහන් ව තිබේ. මේ අනුව ලංකාවෙහි පැවති දක්ෂ ඇත්දත් කැටයම් කලාව, සම් පදම් කොට කරන ලද පත්කඩ කර්මාන්තය සහ ගුජරාටය වැනි රටවල් සමඟ කරන ලද වෙළෙඳ ගනුදෙනු පිළිබඳ මහාවංශයේ සඳහන් නො වන ඇතැම් තොරතුරු නිරාවරණය වීම ද කල්‍යාණී සෙල්ලිපියෙන් සිදු ව තිබේ. මේ ආදී වශයෙන් සලකන විට ලංකාද්වීපයේ බොහෝ ඓතිහාසික තොරතුරු රාශියක් හෙළි කර ගැනීමට  මෙම සෙල්ලිපිය සුවිශාල දායකත්වයක් ලබා දෙන බව පෙනේ.

**පර්යේෂණ නිගමනය**

කල්‍යාණී ශිලා ලේඛනය රාමඤ්ඤරට පිහිටි ශිලාලේඛනයකි. රාමඤ්ඤදේශයේ සම්බුද්ධශාසනය පවිත්‍ර කරනුවස් උපසම්පදාව පිහිටුවීම සඳහා ලංකාවෙන් පිරිසිදු උපසම්පදාව රාමඤ්ඤදේශයට ගෙනයාම පිළිබඳවත් එහි පිරිසිදු ශාසනය පවිත්‍ර කිරීම පිළිබඳවත් කල්‍යාණී සෙල්ලිපියේ සඳහන් වේ. තෘතීය ධර්මසඞ්ගායනාව සිදු වූ ආකාරය හා ලංකාද්වීපයට මෙන් ම රාමඤ්ඤදේශයට ධර්මය ප්‍රචාරය සිදු වූ ආකාරය පිළිබඳ ව සෙල්ලිපියේ සඳහන් තොරතුරු සහ මහාවංශයේ සඳහන් තොරතුරු බෙහෙවින් සමාන ය. ඓතිහාසික ලේඛනවල සඳහන් තොරතුරු මෙසේ ශිලාලේඛනවලින් තහවුරු වීමෙන් එහි සත්‍යතාව තවදුරටත් තහවුරු වේ. මෙම සෙල්ලිපියෙන් දෙරටෙහි දේශපාලනික, ආගමික, සංස්කෘතික ආදී අංශ රැසක ඓතිහාසික තොරතුරු රාශියක් නිරාවරණය කරගත හැකි ය. එබැවින් කල්‍යාණී ශිලාලේඛනය ලංකාද්වීපයේත් රාමඤ්ඤදේශයෙත් බොහෝ ඓතිහාසික තොරතුරු නිරාවරණය කරන ප්‍රාථමික මූලාශ්‍රයක් ලෙස ඉතා ප්‍රයෝජනවත් බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** කල්‍යාණී සෙල්ලිපිය, බුරුමය, වැදගත්කම, ශ්‍රී ලංකාව, සෙල්ලිපි

**මූලාශ්‍රය**


- අමරවංශ හිමි, කොත්මලේ (2004). **ලක්දිව සෙල්ලිපි.** ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.
- උදිත හිමි, හිත්තැටියේ (1956). **ත්‍රිපිටක පරීක්ෂණය.** එඩ්වින් ගුණසිංහ ප්‍රකාශන.
- ගුණවර්ධන, වි. ඩී. එස්. (1997). **සැළලිහිණි සන්දේශය.** කොළඹ: සමයවර්ධන ප්‍රකාශන.
- චන්දරතන හිමි, බෙංගමුවේ සහ සුමන හිමි බානගල (සංස්.). (2018). **පාලි ශාස්ත්‍රීය සඞ්ග්‍රහය.** හෝමාගමඃ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.
- බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (2007). **පාලි සාහිත්‍යය.** බත්තරමුල්ලඃ රත්න පොත් ප්‍රකාශකයෝ.
- බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (2008). **කල්‍යාණී ශිලාලිපි.** වැල්ලම්පිටියඃ චතුර මුද්‍රණාලය.
- **මහාවංශය.** (2003). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.